# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | දුරකථන / தொலைபேசி / Telephone +94 11 2484729 | ෆැක්ස් / பெக்ஸ் / Fax +94 11 2431498 | ඊ-මේල් / மின்-அஞ்சல் / E-mail dgto@tod.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number: TO/CFM/Bank/2018 | ඔබේ අංකය / உமது இல / Your Number: | දිනය / திகதி / Date: 2018.07. 26 |

හාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ: 3/2018

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>අක්‍රිය නිල බැංකු ගිණුම් වසා දැමීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 8 වන පාර්ලිමේන්තුවේ දෙවැනි සැසි වාරයේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 35 හි රජයේ ගිණුම් කාරක සභාවේ පළමු වාර්තාවේ සඳහන් පරිදි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ පවතින නිරවුල් නොකරන ලද අක්‍රිය නිල බැංකු ගිණුම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර ඇති අතර මෙවැනි ගිණුම් සම්බන්ධව විගණකාධිපතිගේ නිරන්තර විගණන විමසුම් වලට භාජනය වන බව නිරීක්ෂණය වේ.

එවැනි අක්‍රිය නිල බැංකු ගිණුම් වසා දැමීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත වරින් වර දැනුම් දුන් නමුදු ඒ මත දක්වන ප්‍රතිචාරය / ප්‍රගතිය ප්‍රමාණවත් නොවන බව ඉහත දක්වා ඇති ගිණුම් කාරක සභා වාර්තාවලින් හා විගණන විමසුම් තුලින් තහවුරු වේ.

එබැවින් ඉහත සඳහන් පරිදි පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා වාර්තාවලින් හෝ විගණන විමසුම් තුලින් පෙන්වා දී ඇති හෝ මෙම දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති අක්‍රිය නිල බැංකු ගිණුම් තවදුරටත් ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ පවතී නම් එවැනි ගිණුම් කඩිනමින් වසා දැමීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දෙමි. **එසේ පියවර ගත් පසු 2015.10.23 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි TOD/BA/03 ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කර 2018.08.20 දින හෝ එදිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.**

මෙම කාර්යය සඳහා ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කිරීමෙන් විෂයගත කරුණු සම්බන්ධයෙන් විගණන විමසුම් වලට ලක්වීම හෝ රාජ්‍ය ගිණුම් කාරක සභාව ඉදිරියේ විමර්ශනයට භාජනය වීම වළක්වා ගත හැක. තවද එය රාජ්‍ය අරමුදල් අරපිරිමැසුම්දායකව හා කාර්යක්ෂමව මෙහෙයවීමට ඉවහල් වන බවද වැඩි දුරටත් පෙන්වා දෙනු කැමැත්තෙමි.

සී.ජේ.කේ. පෙරේරා
භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : (i) විගණකාධිපති

(ii) ලේකම් - රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව